## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!!!

## ගිහි, පැවිදි,චාරිත්‍ර,වාරිත්‍ර, යුතුකම්.

පැවිද්දන් වූ අපට භාග්‍යවතුන්වහන්සේ විසින් පනවා තිබෙන විනය නීතියක් වූ දිනපතා, නිතිපතා, පිරිවානා පොත් වහන්සේගේ මුල් කොටසටම අයත් පිරිත් සූත්‍ර දේශනය වන “දසධම්ම සූත්‍ර” දේශනාවෙන් ප්‍රත්‍යවේශාවන් කලයුතු බවත්, එසේ නොකලහොත් දායකයින්ගේ සිව්පසය වූ චීවර, පිණ්ඩපාත, කුටිසේනා සහ ගිලන්පස බෙහෙත් වර්ග ප්‍රත්‍යාවේශා නොකරන්නේ නම්, ඒවා හොරෙන් පරිහරණයවන්නවුන්සේ අති දීර්ඝකාලීනව මහත් දුක් දෙන නිරයේ අපමණ දුක්විඳ යම් දවසක මිනිසත් ආත්මභාවයක් ලදත් කුලීකරුවන්, මෙහෙකරුවන්, පහත් කුල වල ඉපදෙන්න සිදුවන බව එය තේරුම් ගැනීම පිණිස “දසධම්ම සූත්‍ර” දේශනාවේ කරුණු දහයක් (10) සඳහන් කර, එම කරුණු සිහිකර ලබා ගන්නා වූ උතුම් මිනිසත්භාවයත්, සම්බුද්ධ ශාසනයත් පිහිටාධාර කරගෙන වහ වහා දුක් සසර ගමන නිම කර ගැනීම පිණිස “දසධම්ම සූත්‍ර” දේශනාවේ සඳහන් කරුණු නිති පතා සිහියට ගෙන තමන්ගේ පිං බලාපොරොත්තුවන දායකයින්ට හා තමන්ගේ හතරවරිගෙක ඥාතින්ටත් පිංකෙතක් බවට සැමට මෛත්‍රී සිත වඩා සිව්පස පරිභෝජනය කරන ලෙසත්, ඇසට පෙනෙන නොපෙනෙන දෙවියන්ට, භූතයන්ට, සත්වයන්ටත් විශේෂයෙන් මළගිය අයටත් පිං අනුමෝදනා කර අපට පැමිණෙන්නාවූ මාර පාක්ෂික චිත්ත පිඩා, කායික පීඩා උපේක්ඛාවෙන් විඳ දරා ගැනිමටත්, අග්ගිස්කන්දෝම සූත්‍ර දේශනාවන් කියවා බලා අපගේ අතපසුවීම් දුරලා මෙතැන් පටන් නිතිපතා පාන්දර අවදි වීමත්, පිරිසිදු වී පිරිසිදු වතුර කෝප්පයක් වළඳා බුද්ධ වන්දනාව විනාඩි 40කට සීමාකරගෙන පාන්දර 5ට පටන් ගන්න. ඉන්පසු ගිලන්පස ආදිය ගෙන දවසේ ඉතිරි කටයුතු ආරම්භ කරන සේක්වා’යි සිහිපත් කර දෙමි.

# ගිහි විනය

මෙය දිර්ස විස්තරයක් නිසා විශේෂයෙන් රජයේ සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් පමණක් සඳහන් කරමි. සර්වඥයන් වහන්සේ මීට අවුරුදු 2600කට ආසන්න කාලයක සකල සත්වයා වෙත පතල මහා කරුණාවෙන් වදාල බුදු වදන හා විනය නිතිය එතෙක් මෙතෙක් පරම්පරා 25කටත් වඩා පැරණි බුදු වදන අදටත් එදාටත් වඩා වටිනා බව දන්නා නිසා තමයි පිරිණි වී මාස තුනක් තුළදී අජාසත්ත රජතුමාගේ රාජ්‍ය අනුග්‍රහයෙන් කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ පන්සියයක් රහතන් වහන්සේලා හත්මාසයක් පුරා පිප්පලි ගුහාවේදී පළමු ධර්ම සංඝායනාව අනාගත සම්බුද්ධ ශාසනය පවත්නා අවුරුදු පන්දහස දක්වාම සසර දුකින් මිදීමටත්, අඩු පිං ඇත්තෝ මතු අනාගතයෙහි ලොව පහලවන භාග්‍යවත් අර්හත් මෛත්‍රී තථාගතයන්වහන්සේගේ ශාසනය තුළදී සියළුම සංස්කාර බන්ධනයන්ගෙන් මිදීම පිණිසය.

සැමදා නවීන විද්‍යාව එය අවුරුදු සියයෙන් සියයට පැරණි වන්නේය. සම්මා සම්බුදුරජාණන් වහන්සේගේත් ගුරුවරයා ධර්ම රත්නය, එය පුරුකෙන් පුරුක සේ ඉදිරියට ගෙන යන සංඝ රත්නය ගිහි පින්වතුන්ට පුණ්‍යක්කෙත්ත වී තිබෙන්නේ එම නිසා ත්‍රිවිධ රත්නයටම එක සේ ගරු කරන්න. ඉහත සඳහන් කර තිබෙන ආකාරයට බුදුවදනට පිටුපා කරන වැරදි වල විපාක ඔබ අනුමෝදනා නොවන්න. “මිළින්ද ප්‍රශ්නය” පොත් වහන්සේගේ ඇතුලත්ව තිබෙනවා මිළිඳු රජතුමා අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් “මහරජතුමනි දුෂ්ශීල භික්ෂුවකගෙන් වූවත් ශාසන ලැදි කාරණා 10ක් තිබෙන බව. එම නිසා ඒකාකාරයටම ත්‍රිවිධ රත්නයටම ගරු කරන ලෙස.” ගිහි පින්වතුන් වශයෙන් රාජ්‍ය සේවකයින්ටත් “දස ධම්ම සූත්‍ර” දේශනාව සේම ප්‍රත්‍යාවේක්ෂා කිරීම වන් දෙයක් තිබේ. ඒ රාජ්‍ය සේවකයා යැපෙන්නේ, වරප්‍රසාද ලබා ගන්නේ, විශ්‍රාම වැටුප් ලබා ගන්නේ, අඹු දරු මවු පිය වරප්‍රසාද

ලබා ගන්නේ ජීවත්වන සියළුම පුරවැසියන්ගේ හා මතු උපදින පරපුර උකසට තබා ලබා ගන්නා වූ නොයෙකුත්ආකාරයේ ධනයෙන්ය. ඔබලාගේ නඩත්තුව සඳහා මැද පෙරදිග ගෘහ සේවිකාවන් වශයෙන් යන නුගත් ගම්බද අහිංසක තරුණියන්ගේ ලේ දහඩියෙන්ය.

උදාහරණයක් වශයෙන් ලංකා ගමනා ගමන මණ්ඩලයත් පුද්ගලික බස් සේවයත් (එදා වෙල) අතර තිබෙන පරතරය. එයටත් එහා ගිය දුම්රිය සේවය මුදල් ගෙවා ලබා ගන්නා වූ ප්‍රවේශ පත්‍රය බහින ස්ථානයෙන් පිටවන තෙක් ආරක්ෂා කර නොගත්තොත් වෙන දඬුවම දන්නවානේ. වරප්‍රසාද ඇතිව හෝ නැතිව දුම්රියෙන් ප්‍රයෝජන ගන්නා වු රාජ්‍ය සේවකයින් මේවා දැනගත යුතු අතර, භික්ෂූන්වහන්සේලා ප්‍රත්‍යවේෂා නොකර ගන්නා වූ සිවුපසයට අන්ත පාපකර්මයක් කරගන්නේ සිවුපසය පූජා කරන්නේ කිහිප දෙනෙකි. එයත් කැමැත්තෙන් දෙන දෙයක් පමණි. ගිහියන් වූ ඔබලාගේ (රාජ්‍ය සේවය) දෙමවුපියෝ, අඹුදරුවෝ, වෙනත් සහලේ ඥාතීන්ද එම පාප කර්මයට වග කිවයුතු වන්නේය.

එදා පසේනදි කොසොල් රජතුමා දුටු සිහිනයක් වු දෙපැත්තෙ මුඛ එක හා සමාන ඇතිව එක බඩකට මුඛ දෙකෙන්ම ආහාර ගන්නේය. කොපමණ ආහාර ගත්තත් සෑහීමකට පත්නොවන්නේය. මෙම සිහිනය දුටු වෙලේ පටන් පසුදා පහන්වන තුරුම රජතුමා භියෙන් සැකෙන් සිට පසුදා මල්ලිකා බිසවත් සමඟ බුදුරජාණන් වහන්සේ කරා ගොස් කීවේය. එවිට අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන්වහන්සේ මෙසේ වදාළ සේක.

**"මහරජතුමනි, මෙයට ඔබ බිය නොවන්න. මෙම සිහිනය ඔබට හෝ ඔබගේ රාජ්‍යයට වන අනතුරක් නොව කළියුගයෙහි (අනාගතයෙහි) දිළිඳු රාජ්‍ය පාලන කාලයන්හීදි රාජ්‍ය සේවකයින් කොපමණ වැටුප් හා වරප්‍රසාද ලැබුණත් සෑහීමකට පත් නොවන්නේය. මොන ආකාරයෙන් හෝ අල්ලසම**

**බලා සේවය කරන්නේයය. එය ලැබෙන තෙක් ඔවුන්ගෙන් වන සේවය නොලැබෙන්නේයැයි"** වදාළ සේක.

විශේෂයෙන්ම පැරණි බණ පොත්වල රාජ්‍ය හෝ රාජ්‍ය නොවන නීතිඥයන් ගැනද සඳහන්ව ඇත්තේය. එමනිසා කොරෝනා විෂබීජය නිසා රාජ්‍ය විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප ලබා ගැනිම සඳහා ඇඳිරිනීතිය තිබියදී කොපමණ රාජ්‍ය ධනය, කාලය, ශ්‍රමය වැය කළායැයි සිතා ආදර්ශයට ගෙන අනෙක් අය කිසිම සිව්පසයක් බලාපොරොත්තු නොවේවා'යි ප්‍රාර්ථනා කරමි.



මීට මෙතැති,

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.**

2020 ජුනි මස 05වන පොසොන් පොහෝදා

071-7403900

**[මෙම දහම් පණිවිඩය පින්වත් ඔබ අගය කරන්නේනම් ඡායා පිටපත් ගෙන අතින් අත බෙදන්න.]**